ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# අපරාධ නීති



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# අපරාධ නීති

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

සම්පාදනය
ජනාධිපති නීතිඥ යූ.ආර්. ද සිල්වා, LLB

copyrights@ Legal Aid Commission of Sri Lanka



# සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරීන්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදයම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.


# අපගේ දැක්ම

### යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


| | පිටු අංක |
|---|---|
| අපරාධ යනු කුමක්ද? | 01 |
| නීතිඥ සේවාදායක සම්බන්ධතාව | 02 |
| අ. නීතිඥ මහතා මඟින් පොලිසියට භාරවීමට හැකි බව | 03 |
| ආ. 1997 අංක 30 දරණ ඇප පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අපේක්ෂිත ඇප ඉල්ලීම කල හැකි බව | 04 |
| ඇ. ඒ වන විටත් බී වර්තාවක් ඉදිරිපත් කර තිබේ නම් අධිකරණයට ඉදිරිපත් විය හැකි බව | 06 |
| නඩු විභාගයටත් වඩා සේවාදායකයන් උනන්දු වන ඇප ලබා ගන්නා ආකරය | 08 |
| මහාධිකරණයකදී ඇප ඉල්ලීම | 09 |
| වරදකරු කිරීමෙන් පසු අභියාචනයට යටත්ව ඇප ඉල්ලීම | 11 |
| ඇප සම්බන්ධව නිතර භාවිතා වන සුවිශේෂි කරුණු | 11 |
| අ) වරදකරු වීමට පෙර ඇප ඉල්ලීමේදී සුවිශේෂී කරුණු | 12 |
| ආ) වරදකරු කිරීමෙන් පසු ඇප ඉල්ලීමේ දී සුවිශේෂී කරුණු | 13 |
| කුරුණෑගල මහාධිකරණයේදී | 16 |
| තමන්ගේ දේපල ගැන අවදියෙන් සිටිමට උගන්වන | 22 |
| 66 වගන්තිය යටතේ නඩුකරයක් පැවරූ විට අධිකරණයකට දිය හැකි නියෝග වර්ග | 23 |
| 66 නඩුකරයක් හවුල් දේපලක් සම්බන්ධව පැවරිය නොහැක | 24 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 26 |



## අපරාධ යනු කුමක්ද?

" අපරාධයක් යනු නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදකාරී ක්‍රියාවන් හෝ මඟ හැරීම් වේ. "

# නීතිඥ සේවාදායක සම්බන්ධතාව

නඩුවක සැකකරුවෙකු වී සිටින සේවාදායකයෙකු නීතිඥ මහතකුගේ සරණ පතා එනු ලබන්නේ ඉතාමත් විශ්වාසයකින් වන අතර, එවැනි අවස්ථාවක ඔහු සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ලබා ගන්නා තොරතුරු අනුව පහත සඳහන් ආකාරයේ ක්‍රමවේදයන්ගෙන් එකක් අනුගමනය කිරීමට උපදෙස් ලබා දිය හැක.

**අ**

**නීතිඥ මහතා මඟින් පොලිසියට භාරවීමට හැකි බව**

**ආ**

**අපේක්ෂිත ඇප ඉල්ලීමක් කල හැකි බව**

**ඇ**

**ඒ වන විටත් බී වාර්තාවක් ගොනුකර ඇත්නම් අධිකරණයට ඉදිරිපත් විය හැකි බව**



# අ. නීතිඥ මහතා මඟින් පොලිසියට භාරවීමට හැකි බව

1. සැකකරුවකු වෙනුවෙන් අයිතිවාසිකමක් ලෙස නීතිඥවරයෙකුට පොලීසියේ පෙනී සිටිමට නීතිමය ප්‍රතිපාදන ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුවක් ආශ්‍රයෙන් සකස් කරනු ලැබ එය දැනට ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව ඕනෑම පුද්ගලයකුට පොලිස් ස්ථානයකදී නීතිඥ සහය අයිතිවාසිකමක් ලෙස ලබාගැනීමට හැකියාව ලැබී තිබේ.

**සේවාදායක වෙනුවෙන් පොලිස් ස්ථානයකදී පෙනී සිටින විට නීතිඥවරයෙකු මතක තබාගත යුතු කරුණු**

I. පොලිස් ස්ථානයකට යාමේදී නීතිඥයකු ලෙස හඳුනාගත හැකි වන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී යා යුතු වීම.

ii. නීතිඥ සංගමයේ වලංගු හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු වීම.

iii. පොලිස් නිලධාරින්ට ආමන්ත්‍රණය කිරීමේදී යහපත් වචන භාවිතා කර තම කර්තව්‍ය ඉටුකර ගැනීමට උපරිම උත්සාහය යෙදීම.

iv. පොලිස් නිළධාරින් අල්ලසට යටත්ව හෝ වෙනත් ඔවුනට ආවේණික චර්යාවන් මත ප්‍රවේගකාරී ලෙස හැසිරෙන්නේ නම් එයින් මිදී පැමිණ ඒ බව අධිකරණයට දැනුම් දීම හෝ වඩාත් උත්සන්න අවස්ථාවක් නම් නීතිඥ සංගමයට ලිඛිතව දැනුම් දීම.

v. සැකකරුගේ කට උත්තර ගැනීමේදී නීතිඥ මහතෙකු ඒ අසල සිටීමට ඉඩදීම පොලිසියේ අභිමතය පරිදි වන අතර, ඒසේ ඉඩදුන් අවස්ථාවක බලහත්කාරයෙන් හෝ තර්ජනයෙන් යමක් ලබා ගැනීමට උත්සහා කරන බව පෙනී ගියහොත් එයට විරුද්ධ වීම හැර කට උත්තරයේ කරණු වලට මැදිහත්වීමක් නීතිඥ මහතකුට කළ නොහැකි වීම.

2. සිද්ධිය වන අවස්ථාවේ සේවාදායකයා වෙනත් ස්ථානයක සිටි බවට ස්ථාවරයක් ගන්නේ නම් ඒ බව පොලිසියට කට උත්තර දෙන අවස්ථාවේ දැනුම් දිය යුතු වේ. අන්‍යස්ථානකභාවය තහවුරු කිරීමට සාක්ෂි තිබේනම් ඒ පිළිබඳව සඳහන් කිරීම පසුවට ප්‍රයෝජනවත් විය හැක. තවද එසේ තොරතුරු ලැබූ විට පොලිසිය ඒ පිළිබඳවද සොයා බැලීම විමර්ශනයේ එක් අංගයක් වේ.

3. බොහෝ විට පොලීසිය විසින් සැකකරුගේ කට උත්තරයේ අන්‍යස්ථානකි භාවය ගැන සටහන් කිරීමට ඉඩ නොතිබෙන නිසා සැකකරු පොලීසියට භාරකරන අවස්ථාවේ නීතිඥවරයෙකු වශයෙන් තමන්ගේ ලිපි ශීර්ෂයක ඒ බව ලිඛිතව සඳහන් කර ස්ථානාධිපතිට භාර දිය හැකි අතර, එහි පිටපතට අත්සන් ලබා ගැනීම කල හැක.

4. පොලීසිය විසින් කට උත්තරයේ එය ඇතුළත් නොකළ බව දැනගත්තේ නම් ඔහුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ පොලිසිය විසින් සටහන් නොකිරීම ගැනද අන්‍යස්ථානිකභාවය සම්බන්ධ විස්තරද ගරු මහේස්ත්‍රාත්තුමාට දැන්විය යුතුවේ.

5. එසේ කිරීමටද අවස්ථාවක් නොලැබුණේ නම් ගරු නීතිපතිතුමාට ආමන්ත්‍රණය කරනු ලැබූ ලිපියක නීතිපති දෙපාර්තමේන්තුවට යැවීම කළ යුතු අතර, එයට යොමු අංකයක් නොලැබුණේ නම් විමසා ලබා ගත යුතු වේ. මේ සියල්ල වැදගත් වන්නේ අන්‍යස්ථානිකභාවය සම්බන්ධ නීතිමය තත්වය වර්තමානයේ ඉතාමත් වැදගත්කොට පිළිගන්නා හෙයිනි.

## ආ. 1997 අංක 30 දරණ ඇප පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අපේක්ෂිත ඇප ඉල්ලීම කල හැකි බව

තමන් සම්බන්ධව පොලීසිය සොයනුයේ අසාධාරණ ලෙස රිමාණ්ඩ භාරයට පත්කිරීමේ අභිලාශයෙන් වන බවට සේවාදායකයෙකු පවසන්නේ නම් ඔහුට අපේක්ෂිත ඇප ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කල හැක. එසේ කල හැකි වන්නේ එකී පුද්ගලයාව සොයනු ලබන්නේ ඇප දිය නොහැකි වරදක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී වීමව ඉතා වැදගත් වේ.

එම ඇප දිය නොහැකි වරදට ඇප පනත බලපාන්නේ ද යන්න සොයා බැලීම ඊළඟට ඉතා වැදගත් වේ. ඇප පනතේ 3 වන වගන්තිය අනුව මහජන ආරක්ෂක පනතේ වැරදි ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ වැරදි සහ ඇප පිළිබඳ ප්‍රතිපාදන විශේෂයෙන් සලසා ඇති පනත් වල වැරදි සම්බන්ධව අපේක්ෂිත ඇප ඉදිරිපත් කළ නොහැක.

**අපේක්ෂිත ඇප ඉල්ලුම්පතක් ඉදිරිපත් කල නොහැකි ඇප පිළිබඳ ප්‍රතිපාදන සලසා ඇති වැරදි.**

(I) දැ.නී සංග්‍රහයේ මිනිමැරුම් චෝදනාව සහ මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබිය හැකි වැරදි.
(ii) විෂ වර්ග අබිං හා අන්තරාදායක ඖෂධ පනතේ 54 (අ) සහ (ආ) යටතේ වැරදි.
(iii) පොදු දේපල විෂයෙහි සිදුකරනු ලබන වැරදි.
(iv) අල්ලස් පනත යටතේ සිදු කරනු ලබන වැරදි.
(v) ආගමනය හා විගමන පනත යටතේ වැරදි.
(vi) පීඩාකාරී ආයුධ පනත යටතේ වැරදි.
(vii) තුවක්කු ආඥා පනතේ ස්වයංක්‍රීය ගිනි අවියක් ළඟ තබාගෙන සිටි අවස්ථාවක හෝ ඕනෑම තුවක්කුවකින් වරදක් කර ඇතිවිට.

## අපේක්ෂිත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන අයුරු.

ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට සුදුසු වරදක් බවට තීරණය කල පසු එකී වරද සම්බන්ධව සේවාදායකයා සොයනු ලබන පොලිස් ස්ථානය සොයා ගත යුතු වේ. එකී පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වගඋත්තරකරු කරමින් ඉල්ලීමක් කල යුතු වේ.

I. ඇප ඉල්ලීම පෙත්සම හා දිවුරුම් ප්‍රකාශයක් මඟින් සිදු කෙරේ. එහි ඉල්ලුම්කරුව ඇප දිය නොහැකි වරදක් යටතේ (එම වරද කුමක්ද යන්න වගන්තිය සමඟ සඳහන් කර) සිර භාරයට ගැනීමේ ප්‍රවණතාවක් ඇති බව දැනගන්නට ලැබී ඇති බවට වූ සම්ප්‍රකාශක් ඇතුලත් විය යුතුය. එමෙන්ම ඉල්ලීම සැලකීමේදී අදාල පොලිස් ස්ථානයට දැනුම්දීමක් කර, ඒ බව සනාථ කිරීමට ලියාපදිංචි තැපැලෙන් යැවීමේදී දෙනු ලබන කුවිතාන්සිය අමුණා ඉදිරිපත් කරන බවට හෝ දැන්වීම අතින් භාර දී එසේ දුන් බවට අත්සන් කර ඇති බවට සම්ප්‍රකාශකය ඇතුලත් කිරීමත් අනිවාර්ය වේ. මෝසමක් මඟින් එකී ඉල්ලීම කැඳවීමට අවසර ඉල්ලා සිටිය යුතු වේ. එමෙන්ම සේවාදායකයාගේ හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇතුලත් කිරීම වඩාත් සුදුසුය.

---

ii. ඉල්ලීම ඉදිරිපත් කල යුත්තේ අදාල පොලිස් ස්ථානය අයත් මහේස්ත්‍රාත් අධිකරණයටයි.

---

iii. ඉල්ලීම සනාථ කරනු ලබන අවස්ථාවේ සැකකරු (ඉල්ලුම්කරු) අධිකරණයේ සිටීම අත්‍යවශ්‍යය නොවේ.

---

iv. ඉල්ලීම සනාථ කල පසු ගරු මහේස්ත්‍රාත්තුමා විසින් විමසීම සඳහා සතියක් ඇතුලත දිනයක් නියම කර වගඋත්තරකාර ස්ථානාධිපතිට සහ ඉල්ලුම්කරුට එම දිනය ඇතුලත් දැන්වීමක් යැවීමට නියම කරනු ලැබේ.

---

v. විමසීම් කරනු ලබන අවස්ථාවේ ඉල්ලුම්කරුට පෞද්ගලිකව කරුණු දැක්විය හැකි අතර, එසේ නොමැති නම් ඔහුගේ නීතිඥ මහතාට කරුණු දැක්විය හැකි වේ. ව්‍යවස්ථාදායකය විසින් එසේ සඳහන් කර තිබීමෙන් ඉල්ලුම්කරු එදිනට පෙනී සිටීම අනිවාර්ය නොවන බවට තර්ක කල හැකිය.
පොලිස් ස්ථානාධිපති හෝ ඔහුගේ නියෝජිතයාගෙන් ඊළඟට කරුණු විමසනු ලැබේ.

---

vi. අධිකරණයට එහිදී වගඋත්තරකරුගෙන් දැනගත යුතුව ඇත්තේ අදාල ඉල්ලීම සම්බන්ධ අධිකරණ බලය තිබේද? වරද ඇප දිය නොහැකි වරදක්ද? එය ඇප පනත යටතට වැටෙන වරදක්ද? ඉල්ලුම්කරුව ඒ සම්බන්ධව අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවයක් තිබෙන්නේද? යන්නයි.

vii. ඉහත කරුණු සම්පූර්ණ වන්නේ නම් ගරු මහේස්ත්‍රාත්තුමාට කොන්දේසි වලට යටත්ව ඇපයක් නියම කිරීමේ හැකියාව තිබේ.

viii. මෙවැනි ඉල්ලීමකදී විදේශ ගමන් බලපත්‍රය අධිකරණයට භාරදීමට ඒ ඒ වරදේ ස්වභාවය අනුව අධිකරණය විසින් නියම කළ හැකි අතර එසේ විදේශ ගමන් බලපත්‍රයක් නොමැති නම් ඒ බව අධිකරණයට දැනුම් දීම කළ යුතු වේ. සමහර අධිකරණ ඒ බව දිවුරුම් ප්‍රකාශයකින් සනාථ කරන ලෙසට දැනුම් දෙනු ලැබේ. විදේශ ගමන් බලපත්‍රය අධිකරණය භාරයේ තිබුණද අත්‍යවශ්‍ය කරුණකට විදේශ ගමන් බලපත්‍රය ලබාගත හැක. එසේ ලබාගන්නා විදේශ ගමන් බලපත්‍රය පෙරලා දිවයිනට පැමිණි වහාම නැවත අධිකරණයට භාරදිය යුතුවේ.

ix. විභාගයට නියම කර දැන්වීමක් ලැබී ඇති අවස්ථාවක පනතේ 25 වන වගන්තියට අනුව ඉල්ලුම්කරුව අත්අඩංගුවට ගැනීමට පොලීසියට බාධාවක් නොමැති හෙයින් එසේ නොවීමට තමන් විසින් වග බලාගන්නා ලෙස සේවාදායකයාට උපදෙස් දීම යෝග්‍ය වේ.

## ඇ. ඒ වන විටත් බී වාර්තාවක් ඉදිරිපත් කර තිබේ නම් අධිකරණයට ඉදිරිපත් විය හැකි බව

I. එකී "බී වාර්තාවේ" සේවාදායකයාගේ නම තිබේදැයි දැනගත යුතු වේ.


ii. බී වාර්තාවේ නම නොමැති නම් පොලිසිය විසින් සේවාදායකයාට පොලිසියට පැමිණීමට යම් ලේඛනයක් බාරදී තිබේ නම් එයද වැදගත් වේ.

iii. පොලීසිය පැමිණෙන දිනයකදී මෝසමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ඊළඟට නඩුව දැඳවන දිනයේදී හෝ සැකකරු අධිකරණයට ඉදිරිපත් කල හැකි අනන්‍යතාවය තහවුරු කිරීමට සැකකරුගේ හැඳුම්පත අත්‍යවශ්‍ය වේ.

iv. සැකකර ඉදිරිපත් කළ චෝදනාව ඇප ලබාගත හැකි චෝදනාවක් නම් ඇප පිට මුදා හැරිය පසු පොලීසියට ගොස් ඕනෑම අවස්ථාවක කටඋත්තර දීමට සූදානම් බව දැන්විය යුතු වේ. රිමාන්ඩ් භාරයට පත්කරනු ලැබූ නඩුවක රිමාන්ඩ් භාරයේ දී කට උත්තර ගැනීමට අධිකරණයේ නියම කරනු ලැබේ. පොලීසිය ඔහුව එකී නඩුවට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කිරීමට ඉඩ තිබේ. එවැනි අවස්ථාවක ඒ බව සටහන් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටිය යුතු වේ.

v. ජීවිත තර්ජන හේතුවෙන් එම ප්‍රදේශයට යැමට බියක් දක්වන සැකකරුවකු වෙනුවෙන් අදාල "බී වාර්තාවේ" සහතික පිටපතක් ලබා ගෙන එය සමඟ පෙත්සමක් දිවුරුම් ප්‍රකාශයක් මඟින් නියමිත අධිකරණයට ඉදිරිපත් කර රිමාන්ඩ් භාරයේ ඊලඟ නඩු දිනයේ අදාල අධිකරණයට ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටිය හැක.

ඉහත දක්වා ඇති ආකාරයට සැක කරන පුද්ගලයකු  අධිකරණයට ඉදිරිපත් කල පසු නීතිඥ මහතකුගේ ඊලඟ වගකීම වන්නේ එකී සැක කරන පුද්ගලයාව ඇප පිට නිදහස් කරවා ගැනීමයි. අධිකරණයට ඉදිරිපත් නොවී විදේශගතව සිටින විත්තිකරුවෙකු වෙනුවෙන් නීතිඥ මහතකුට පෙනීසිටීමට හැකියාව තිබේ. විදේශගත සිටින අය නීතිඥ මහතකුට උපදෙස් දුන්විට ඒ මහතා තමන්ට උපදෙස් ලැබී ඇති බව ප්‍රකාශ කළවිට එය අභියෝගයට ලක් කළ නොහැක.



# නඩු විභාගයටත් වඩා සේවාදායකයන් උනන්දු වන ඇප ලබා ගන්නා ආකාරය

යම් සේවාදායකයකු වෙනුවෙන් ඇප ඉල්ලීමක් සිදු කිරිම අදාල වරදේ ස්වාභාවය අනුව මහේස්ත්‍රාත් අධිකරණයේදී, මහාධිකරණයේදී හෝ අභියාචනාධිකරණයේදී කළ හැක.

**මහේස්ත්‍රාත් අධිකරණයක ඇප ඉල්ලිම**

දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ චෝදනාවකට හැර එම සංග්‍රහයේ අනිකුත් ඇප දිය හැකි හා ඇප දිය නොහැකි වරදවල් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ඉල්ලීමක් කළ හැක. නඩුව අධිකරණයේ කැඳවන අවස්ථාවේදී හෝ මෝසමක් මඟින් හෝ ඇප ඉල්ලීමක් සිදුකල හැකිවේ.

මහේස්ත්‍රාත් අධිකරණයකින් ඇප ඉල්ලා සිටීමට හැකි අනෙකුත් පනත් වල දක්වා ඇති වරදවල් වන්නේ,

අ) විෂ වර්ග අබිං හා අන්තරාදායක ඖෂධ පනතේ 78 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කල බවට චෝදනා කර ඇති විටී

ආ) ගිනි අවි ආඥා පනතේ ස්වයංක්‍රීය නොවන ගිනි අවියක් සන්තකයේ තබා ගැනීමක් සම්බන්ධ චෝදනා කර ඇති විට.

ඇ) රේගු ආඥා පනතේ රුපියල් මිලියනයට වඩා අඩු වටිනාකමකින් යුක්ත වරදවල් කර ඇති විට.

ඈ) ආගමන විගමන  පනතේ 45 (ඇ) යටතේ හැර අනිකුත් වගන්ති ප්‍රකාරව චෝදනා කර ඇති විට.

ඉ) අල්ලස් පනතේ 30 (අ) 1 (ආ) වගන්තිය යටතේ සහතිකයක් මඟින් චෝදනා ඉදිරිපත් කර ඇති විට.

ඊ) රජයේ දේපල පිළබඳ වැරදි පනත යටතේ වරදක් කල බවට චෝදනා නගා එකී චෝදනාවේ වටිනාකම රු.25,000.00 ට වඩා විට සුවිශේෂී හේතු මත අල්ලස් පනතේ අනෙකුත් වගන්ති ප්‍රකාරව වරදවල් කල බවට සහ රජයේ දේපල පිළබඳ පනතේ රු.25,000.00 ට වඩා වටිනාකම වැඩි නොවන අවස්ථාවලදී සාමාන්‍ය ආකාරයට.

උ) හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අත්අඩංගුවේ පසුවන අයෙකුට නීතිපතිතුමාගේ ලිඛිත අනුමැතිය ඇති විට.

ඌ) පනතක ඇප සම්බන්ධව ප්‍රතිපාදන නොමැති විට නියම කළ හැකි සිරදඬුවම මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ උප ලේඛනයෙහි ඇප දිය හැකි හෝ ඇපදිය නොහැකි වශයෙන් නම් කර ඇති විට.

# මහාධිකරණයකදී ඇප ඉල්ලීම

මහාධිකරණයක ඇප ඉල්ලීම බොහෝ දුරට සිදුවන්නේ වාචිකව වන අතර සමහර අවස්ථාවලදී ලිඛිතව ඉල්ලම් කිරීමට අධිකරණය විසින් අවසර දෙනු ලැබේ.

අ) ඇප පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව මරණීය දණ්ඩණය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් නියම කල හැකි වරදවල් සම්බන්ධව චෝදනා නඟා ඇත විට.

ආ) විෂ වර්ග අබිං හා අන්තරාදායක ඖෂධ පනතේ 54 (අ) හෝ (ආ) වගන්ති ප්‍රකාරව චෝදනා කර ඇතිවිට සුවිශේෂී අවස්ථාවලදී.

ඇ) රේගු ආඥා පනතේ රුපියල් මිලියනයට වඩා වැඩි වටිනාකමකින් යුක්ත වරදවල් කර ඇති බවට චෝදනා කර ඇති විට.

ඈ) ආගමන විගමන පනතේ 45 (ඇ) වගන්තිය ප්‍රකාරව චෝදනාකර ඇතිවිට, සුවිශේෂී අවසථාවලදී.

ඊ) පීඩාකාරී ආයුධ පනත යටතේ චෝදනා ඉදිරිපත් කර ඇති විට.

ඊට අමතරව

මහේස්ත්‍රාත් අධිකරණයක ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කල විට ඇප ලබා ගැනීමට හෝ නියම කර අති ඇපය අඩු කර ගැනීමට හෝ ප්‍රතිශෝධන ඉල්ලීමක් මහාධිකරණය වෙත යොමු කළ හැක.

> "එමෙන්ම මහාධිකරණයක වරදකරු වූ විට අභියාචනයට යටත්ව ඇප ඉල්ලීමක් ප්‍රථමයෙන් මහාධිකරණයට ඉදිරිපත් කළ යුතුවේ. මහේස්ත්‍රාත් අධිකරණයක වරදකරු කරනු ලදුව අභියාචනයට යටත්ව ඇප ඉල්ලීමක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති විට ප්‍රතිශෝධන ඉල්ලීමක් මඟින් ඇප ඉල්ලීම මහාධිකරණය වෙත යොමු කළ යුතුය."

සාමාන්‍යයෙන් අධිචෝදනාවක් මත චෝදනාකර ඇති අවස්ථාවක වාචිකව ඇප ඉල්ලීම සිදු කෙරේ. අනෙකුත් අවස්ථා වලදී මහාධිකරණයකට ඇප ඉල්ලීම ලිඛිතව කරනු ලැබේ. එකී ඉල්ලීම පෙත්සම් හා දිවුරුම් පෙත්සම් මඟින් සිදුකල යුතුවේ. ඇප ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ කුමන වගන්තිය ප්‍රකාරව ඇප ඉල්ලන්නේද යන්න සඳහන් කිරීම කළයුතු අතර ඊට ප්‍රථම මෙවැනි ඇප ඉල්ලීමක් සිදුකර තිබේ ද යන්න පිළිබඳ සම්ප්‍රකාශයක් ඇතුල්ත කිරීම ද අනිවාර්‍යවේ.

සුවිශේෂී කරුණු මත ඇප ඉල්ලමේදී වෙනම ඡේදයකින් එකී සුවිශේෂ කරුණු මොනවාද යන්න සඳහන් කිරීම කළ යුතුවේ. ඇප ඉල්ලුම් පත්‍රය ගොනුකරන අවස්ථාවේදී සමහර අධිකරණ වල වග උත්තරකරුවන්ගේ පිටපත්ද කාර්යාලයට භාරදිය යුතුවේ. සමහර අධිකරණ ඇප ඉල්ලුම් පත්‍රයක පෙත්සමට හා දිවුරුම් ප්‍රකාශයට මුද්දර ගාස්තු අයකෙරේ.

කිසිඳු අවස්ථාවක දිවුරුම් ප්‍රකාශයේ දිවුරුම් කොමසාරිස් ලෙස පෙනී සිටින නීතිඥ හෝ එම නඩුවට පෙනී සිටින ඔහුගේ කණිෂ්ඨ නීතිඥ විසින් හෝ අත්සන් තැබිය යුතු නොවේ. නොතිසි නිකුත් කිරීමට නියම කළ විට වග උත්තර කරුවන්ට යැවීමට නොතීසි සකසා කාර්යාලයටක භාරදිය යුතුය. එසේ භාරදීමෙන් පසු නියමිත පරිදි නොතිසි යවා තිබේද යන්න සොයා බැලීම් කළ යුතුවේ.

සමහර අධිකරණ නිළධාරීන් අවශ්‍ය මුද්දර ගාස්තු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒ ගැන නීතිඥ මහතාට දැනුම් දීමක් නොකර සටහනක් පමණක් යොදා නොතීසි නිකුත් නොකරයි. එසේ හෙයින් ඇප ඉල්ලුම්පත ගොනු කරන අවස්ථාවේදී නීතිඥ මහතාගේ දුරකථන අංකය ලේඛණාගාරයට ලබා දී ප්‍රශ්ණගත තත්වයක් තිබේ නම් දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිමෙන් තවත් දිනකට ඇප ඉල්ලීම නොතීසි භාර දීම සඳහා කල්යාම වලත්වාගත හැකිය.

මහාධිකරණයෙන් ඇප ලබාගත යුතු අවස්ථාවන්හි එකී ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප වු විට ප්‍රතිශෝධන ඇප අයදුම්පතක් මඟින්

මහාධිකරණයක වරදකරු කරනු ලැබ අභියාචනයට යටත්ව ඇප ඉල්ලීමක් කර එය ප්‍රතික්ෂේප කරනු ලැබු විට ප්‍රතිශෝධන ඇප අයදුම්පතක් මඟින් අභියාචනාධිකරණයෙන් ඇප ඉල්ලීම කළ හැකි වේ.

අභියාචනාධිකරණයේ ඇප ඉල්ලීම පෙත්සම් හා දිවිරුම් ප්‍රකාශය මඟින් සිදු කරන ලබන අතර එයට පෙරකලාසියක් ද ඇතුලත් කළයුතුවේ. තවද ඇප ප්‍රතිශෝධන ඉල්ලීම ගොනුකරන අවස්ථාවේ එය සනාථ කිරීම සඳහා කැඳවීමට පහසු දින තුනක් මෝසමේ සඳහන් කළ යුතු වේ.

1998 අංක 24 දරණ පුරාවස්තු පිළබඳ පනත යටතේ ඇප දීමට කුමන අධිකරණයකට හෝ බලය නැත.

ඇප පනතේ 3 වන වගන්තියේ දක්වා ඇති පරිදි එය ඇප පිළිබඳ විශේෂයෙන් සඳහන් වන පනතක් වන හෙයින් ඇප පනත බලපාන්නේද නැත.

## වරදකරු කිරීමෙන් පසු අභියාචනයට යටත්ව ඇප ඉල්ලීම

මෙහිදී මහේස්ත්‍රාත් අධිකරණයක නඩු විභාගයේදී වරදකරු කර දුන් තීන්දුවට එරෙහිව අභියාචනා පෙත්සමක් ගොනු කිරීම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තිය ප්‍රකාරව කරනු ලැබේ. ඉන්පසුව මුල් අධිකරණයට ආමන්ත්‍රණය කරන ලද මෝසමක් මඟින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 323 වගන්තිය ප්‍රකාරව අභියාචනයට යටත්ව ඇප ඉල්ලා සිටිය යුතුවේ. ඇප පනතේ 323 වගන්තිය ප්‍රකාරව අභියාචනයට යටත්ව ඇප ඉල්ලා සිටිය යුතුවේ. ඇප පනතේ 19 වගන්තියට අනුව මහේස්ත්‍රාත්තුමාට පනතේ රීතියට අනුව ඇප දීමට අභිමතය ඇති අතර එහි ව්‍යතිරේඛ අවස්ථාව අනුගමනය කල යුත්තේ වරදේ බරපතලකම සහ විත්තිකරුගේ පූර්ව ක්‍රියාකලාපය යන දෙකම එකට සලකා බව පැහැදිලිව සඳහන් කර තිබේ. මහේස්ත්‍රාත්තුමා ඇප දීම ප්‍රතික්ෂේප කළ යුත්තේ හේතු සඳහන් කිරීමෙන් වන අතර එකී හේතුමත හෝ හේතු නොමැති වීම මත ඇප ප්‍රතිශෝධන ඉල්ලීමක් මහාධිකරණයට කළහැක. එසේ කරණු ලබන්නේ 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන අනුවයි.

මහාධිකරණ නඩු විභාගයේ දී වරදකරු කරමින් දුන් තීරනයකට එරෙහිව අභියාචනා පෙත්සමක් ගොනුකිරීමට අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ 331 වන වගන්තිය ප්‍රකාරව සිදුකර එහි 333 වගන්තිය ප්‍රකාරව මහාධිකරණයට ආමන්ත්‍රණය කරන ලද පෙත්සමක් දිවුරුම් ප්‍රකාශයක් 333 මඟින් ඇප ඉල්ලීම සිදු කරනු ලැබේ. මාහාධිකරණය අභි යාචනයට යටත්ව ඇප ඉල්ලීම කොටස් 02කට බෙදා වෙන්කර දැක්විය හැක. සිරදඬුවම බරපතල වන අවස්ථාවකදී සුවිශේෂි කරුණු මත ඇප ඉල්ලා සිටිය යුතු වන අතර, අඩු සිරදඬුවමක් ඇති විට සුවිශේසී හේතු නොමැතිව කොන්දේසි සහිත ඇපයක් නියම කිරීමේ අභිමතානුසාරි බලය මහාධිකරණ විනිසුරු සතුව පවති.

## ඇප සම්බන්ධව නිතර භාවිතා වන සුවිශේෂි කරුණු

අපගේ නීතියේ ඇප සම්බන්ධව ප්‍රතිපාදනයන් සමහරකට සුවිශේෂී කරුණු යටතේ ඇප ලබා දිය හැකි යන්න ඇතුලත් කර ඇති නමුත් කිසිඳු නීතියක සුවිශේෂී කරුණු මොනවාද යන්න පෙන්වා දී නැත.

නඩු තීන්දු සලකා බැලීමේදී පෙනී යන්නේ ඒ ඒ අවස්ථාවලදී දක්වා ඇති ඇතැම් කරුණු සුවිශේෂි කරණු නොවේ යන්න සඳහන් කර තිබීම පමණි. එක් නඩුවක සුවිශේෂි කරුණු නොවේ යනුවෙන් සඳහන් කරුණු වෙනත් නඩුවක සුවිශේෂි කරුණු ලෙස සලකා ඇති අවස්ථාද තිබේ. ඒ අනුව පැහැදිලි කරුණක් වන්නේ ඒ ඒ නඩුවට අදාලව අධිකරණයෙන් අධිකරණයටද සුවිශේෂී කරුණු වෙනස් වන බවයි. තවද නඩුවේ වරදකරු වීමට පෙර සුවිශේෂී කරුණු නඩුවේ වරදකරු වීමෙන් පසු සුවිශේෂී කරුණු යනුවෙන්ද වෙනස්ව දැක්විය හැක.

## අ) වරදකරු වීමට පෙර ඇප ඉල්ලීමේදී සුවිශේෂී කරුණු

### දීර්ඝ කාලයක් බන්ධනාගාරගතව සිටීම

මරණ දණ්ඩණයෙන් හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම මඟින් හෝ දඬුවම් කල හැකි වරදකට වසරක කාලයක් රිමාන්ඩ් භාරයේ සිටින ඇප පනත බලබාන අයකු අනිවාර්යෙන්ම ඇප පිට මුදා හැරිය යුතු වේ. මෙය ඇප පනතේම සුවිශේෂී කරුණක් ලෙස සලකා ඇති බව පෙනීයයි.

මාස 12ක කාලයකට වඩා වැඩියෙන් රඳවා තබාගත යුතු බවට නීතිපති තුමා තීරණය කරනු ලබන්නේ නම් එතුමා විසින් ඇප පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව කරනු ලබන ඉල්ලීමක් මහාධිකරණයට ඉදිරිපත් කර මනා හා ප්‍රමාණවත් හේතු මත නියෝගයක් මාස 12ක කාලය ඉක්මවා යාමට ප්‍රථම ලබාගත යුතුවේ.

### මෙහිදී වැදගත් කරුණක් වන්නේ

මහාධිකරණයකට සැකකරුගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇප ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධ විමසීමේදී වගඋත්තරකරු ලෙස නම් කර ඇති නීතිපති තුමාට ඇප පනතේ 17 වන වගන්තියේ පිළිසරණ ඉල්ලා සිටිය නොහැකි වීමයි.

මහාධිකරණයක් විසින් 17 වන වගන්තිය යටතේ නියෝගයක් නොමැති නම් වසරක් සම්පුර්ණ වන දිනයේ අනිවාර්යෙන්ම ඇප ලබා දිය යුතු වේ. ඒ අනුව එකී නඩුවේ පරීක්ෂණ කටයුතු අවසන් නොවීම, පෙරවැරදි ඇති බව, පවතින නඩු තිබීම, හෝ 14 වන වගන්තියේ සඳහන් කිසිවක් හෝ නොසලා ඇප ලබාදීම මහාධිකරණය විසින් කලයුතු වේ.

> “ මෙම තත්ත්වයට අදාලව ප්‍රබල කරුණක් ලෙස පෙන්වා දිය හැක්කේ 16 වන වගන්තියට යොදා ඇති වචන අනුව වසර සම්පූර්ණ වී එක් දිනක් හෝ පුද්ගලයෙකු අත්අඩංගුවේ තබාගන නොලැබිය යුතුය යන්නෙන් අදහස් කරනුයේ වසර සම්පූර්ණ වන දිනයේ මහේස්ත්‍රාත්තුමා විසින් එවකටත් මහාධිකරණ නියෝගයක් නොමැති නම් ඔහුව තවදුරටත් රිමාන්ඩ් භාරයට පත් නොකර මුදාහැරිය යුතු බවයි. ”

එසේ හෙයින් වසරක් සම්පූර්ණව සිටින ඇප පනත බලපාන ඕනෑම තැනැත්තෙකු වෙනුවෙන් ඔහු වරදකරුව දණ්ඩන නියමයකට යටත්ව නොමැත්තේ නම් නීතිඥමහතකුට එකී තැනැත්තාව තවදුරටත් රිමාන්ඩ් භාරයේ රඳවා තැබීම නීතියට පටහැනි කරුණ මත ඔහුව මුදා හැරීමට මහේස්ත්‍රාත්තුමාගෙන් ඉල්ලා සිටිය හැකියි

**අනෙකුත් සුවිශේෂී කරුණු**

- රෝගීභාවය-ශල්‍යකර්මයකට භාජනය කලයුතු අයකු බවට හෝ එකී රෝගී තත්වයට බන්ධනාගාර පරිසරය සුදුසු නොවන බවට විශේෂඥ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම.

- එමෙන්ම තම බිරිඳගේ හෝ දරුවකුගේ අසාධ්‍ය රෝගී කාරක තත්වය ගැන විශේෂඥ වෛද්‍ය වර්තා ඉදිරිපත් කිරීම.

- අධ්‍යාපන උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ විභාගය අභියස දරුවා සිටින විට පියා හෝ මව රිමාන්ඩ් භාරයේ සිටීම.

- මව සහ පියා දෙදෙනාම රිමාන්ඩ් භාරයට පත්ව සිටින විට දරුවා හෝ දරුවන් රැකබලා ගැනීමේ අවශ්‍යතාව.

## ආ) වරදකරු කිරීමෙන් පසු ඇප ඉල්ලීමේ දී සුවිශේෂී කරුණු

**දීර්ඝ කාලීන බන්ධනාගාරතව සිටිම**

අවුරුදු 15ක පමණ දීර්ඝ සිරදඬුවමක් නියම කරනු ලැබූ අයකු අවුරුදු 1 1/2 ක් පමණ අභියාචනය විසඳන තුරු බන්ධනාගාරගතව සිටිම සුවශේෂී කරුණක් ලෙස සැලකිය හැක.

රෝගීභාවය

වරදකරු කර තිබීම නීතියට සම්පූර්ණයෙන් පටහැනිව සිදුකර ඇතිවිට,

ඇප ඉල්ලුම් පත්‍රයකට එරෙහිව ගොනුකරනු ලබන විරෝධතාවන්හි පිටපත් පෙත්සකරුගේ නීතිඥ මහතාට ලබාගත හැකි වේ.

## ඇප වර්ග

01. මුදල් ඇප - මුදලින් ඇප තැබීමයි.

02. සහතික ඇප - මුදලින් හෝ ඔප්පුවකින් ඇප තැබීමයි.

03. ශරීර ඇප - සැකකරු හෝ විත්තිකරු වෙනුවෙන් වෙනත් අයෙකු (නියමිත මුදලකට) අත්සන් තැබීමයි.

04. පුද්ගලික ඇප - නියමිත මුදලකට සැකකරු හෝ විත්තිකරු අත්සන් තැබීමයි.

05. පොලිස් ඇප - ඇප දිය හැකි වරදකට පොලීසියේ ස්ථානාධිපති විසින් බැදුම් කරයක් මත මුදා හැරීමයි.

ඔප්පුවකින් ඇප තැබීමේදී එකී ඔප්පුව හවුල් ඉඩමක් නොවිය යුතුය. උකස් ඔප්පුවක් නොවිය යුතුය අදාල ඔප්පුව ඉදිරිපත් කිරීමේදී වටිනාකම් සහතිකයක් ලබාගත යුතුවේ. එකී වටිනාකම් සහතිකය ග්‍රාමසේවකගෙන් ලබාගත ප්‍රාදේශීය ලේකම් සහතික කළයුතු වේ. ඒ සඳහා වටිනාකමෙන් 1% ක මුදලක් ගෙවිය යුතුවේ. ඊට අමතරව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් අදාල ඉඩමේ උධෘතයක් ලබා ගත යුතු වේ.

ශරීර ඇප තැබීමේදී පදිංචි බවට ග්‍රාම සේවක සහතිකය හා / හෝ පොලිස් වාර්තාව වැදගත් ලේඛන වේ. එමෙන්ම ශරීර ඇප තබන්නාට වත්කම් සහතිකයක් ගෙන ඒමට සමහර අධිකරණ නියම කරනු ලැබේ. එමඟින් එකී ඇපකරුට නැවත නොලැබෙන මුදලක් එකී සහතිකය සඳහා ගෙවීමට සිදු වේ.

## ඇපකරුවන්ගේ කාර්යභාරය

1. සැකකරු හෝ විත්තිකරු අධිකරණයට නියමිත දිනවල ඉදිරිපත් කරවීම. විත්තිකරු අධිකරණයට ඉදිරිපත් වන අවස්ථාවක ඇපකරු පැමිණීම අත්‍යවශ්‍ය නොවන නමුත් සමහර අධිකරණ ඇපකරුවන් ද පැමිණිය යුතු බවට රීති සාදාගෙන තිබෙන බව පෙනී යයි.

2. සැකකරු හෝ විත්තිකරු අධිකරණය ඉදිරියේ සිටින ඕනෑම අවස්ථාවක ඇපකරුට ඇපකාරීත්වයෙන් මිදීමට ඉල්ලීමක් කල හැකි. එවැනි අවස්ථාවක එකී සැකකරුට හෝ විත්තිකරුට වෙනත් ඇපකරුවෙකු සොයා ගැනීමට සිදුවේ. එසේ සොයා ගැනීමට නොහැකි නම් එම සැකකරු හෝ විත්තිකරු රිමාන්ඩ් භාරයට පත්වේ. මන්ද එවැනි විටක ඇපකරුට ඇපකාරීත්වයෙන් මිදීමට අයිතිවාසිකමක් ඇති බැවිනි.

3. සැකකරුට හෝ විත්තිකරුට අධිකරණයේ පෙනී සිටීමට නොහැකි අවස්ථාවක ඒ බව අධිකරණයට පැමිණ ප්‍රකාශ කිරීම ඇප කරුගේ වගකීමයි. යම් සැකකරුවෙකු හෝ විත්තිකරුවෙකු රිමාන්ඩ් භාරයේ සිටිනම් ඒ පිළිබඳ විස්තර අදාල බන්ධනාගාරය සහ රිමාන්ඩ් අංකය සපයා දීම හෝ ඔහු අසනීපව සිටිනම් ඒ බවට වෛද්‍ය සහතිකයක් ලබා ගෙන හෝ නොගෙන අධිකරණයට පැමිණ දැනුම් දීම කල යුතු වේ. වෛද්‍ය සහතිකය ඉදිරිපත් කිරීමේදී අදාල දිනයේ අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට නොහැකි බව එහි සඳහන්ව තිබීම අනිවාර්ය වේ.

4. සැකකරු හෝ විත්තිකරු අධිකරණය නොපැමිණි විට ඔහුට වරෙන්තුද ඇපකරුට නොතිසිද නිකුත් කරනු ලැබේ. නොතිසයේ සඳහන් දිනයේදී ඇපකරු නොපමිණියේ නම් ඔහුටද වරෙන්තු නිකුත් වේ. වරෙන්තුවට අත්අඩංගුවට ගත් විට ඇපකරු රිමාන්ඩ් භාරයට පත්වීමේ ප්‍රවනතාවයක් ඇත. නිසි ලෙස අධිකරණයේ පෙනී සිටින ඇපකරුවෙකුට, සැකකරු හෝ විත්තිකරු නොපැමිණීම නිසා රිමාන්ඩ් භාරයට පත්කල නොහැක.

5. සැකකරු හෝ විත්තිකරු අධිකරණයේ දෙනු ලබන ඉදිරි දිනයක ඉදිරිපත් කිරීමට ඇපකරුට නොහැකි වුවහොත් ඔහු විසින් තබා ඇති ඇපය රාජසනත්ක නොකිරීමට හේතු ඇත්නම් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දිය යුතුය. හේතු සම්බන්ධව අධිකරණය සෑහීමකට පත්නොවුවහොත් එකී ඇපය රාජසන්තක කිරීමට නිමය කෙරේ. මුදල් ඇපයක් තබා ඇත්නම් එය රාජසන්තක වේ. ශරීර ඇපයක් තබා ඇත්නම් ඒ නියමිත මුදලේ ප්‍රමාණය හෝ අධිකරණය නියම කරන ප්‍රමාණය ගෙවීමටද සිදු වේ.

6. එසේ නියම කරන මුදල දඩයක් ලෙස ගෙවීමට නොහැකි වු විට පමණක් ඇපකරුට සිර දඬුවම් විඳිමට සිදු වේ. නියම කරන මුදල ගෙවූ ඕනෑම අවස්ථාවක සිර දඬුවමින් මුදාගත හැකිවේ. නියම කරන මුදල ගෙවීමට කල් ඉල්ලා සිටිය හැක. කල් දීමක් කල විට ඇපකරු මුදල් නොගෙවන්නේ නම් ඔහුගේ දේපල තහනමට ගෙන විකිණීම කල හැක. එකී පියවර අසාර්ථ වූ විටක සිර දඬුවම් නියම කල යුතුය.

7. ඇප තබා ඇති සැකකරුවකු හෝ විත්තිකරුවකු වෙනත් නඩුවක රිමාන්ඩ් භාරයේ සිටීම නිසා අධිකරණයට නොපැමිණිය හොත් හෝ පොලිසියට වාර්තා කිරීමට අපොහොස්ත වුවහොත් ඇප අවලංගු කිරීමට හැකි වන්නේ මීට ඉහත අවස්ථාවලදී අධිකරණයට නොපැමිණ මඟහැර ඇති බවට කරුණු වාර්තා වන්නේනම් පමණි.

## කුරුණෑගල මහාධිකරණයේදී

1997 අංක 30 දරණ ඇප පනතේ 13 වන ගනතිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ඇප ඉල්ලුම් පත්‍රයයි.

රාජකාරී මුදියන්සේලාගේ කපුරු බණ්ඩාර කුසුම්, මාකඳුර, පන්නල

VS

**1. නීතිපති තුමා,** නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

**2. ස්ථානාධිපති,** පොලිස් ස්ථානය, පන්නල, වගඋත්තරකරු.

පෙත්සම්කරු

එදිරිව

ආර්.එම්. සුවඳ බණ්ඩාර තුන්වන සැකකරු

කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණ
නඩු අංක :B 278 / 2010
මහාධිකරණ ඇප ඉල්ලුම්පත් අංක :BA61/2010

වර්ෂ 2010 ක් වු ජුලි මස 24 වන දින දීය, ගරු මහාධිකරණ විනිසුරුතුමන් වෙතටයි.

ඉහත නම සඳහන් පෙත්සම්කරු සිය නීතිඥ උත්පල අතුකෝරල මහතා මඟින් පෙනී සිටිමින් මෙසේ ප්‍රකාශ කර සිටී,

1. මෙම නඩුවේ තුන්වන සැකකරු ඉහත නම සඳහන් පෙත්සම්කරුගේ පුත්‍රයා වේ.

2. ඉහත නම සඳහන් සැකකරු 2010 ජනවාරි මස 5 වන දින ගල්ගමුගේ රසාංග ද සිල්වා යන අයගේ මරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන බව දැනගත් වහාම පන්නල පොලීසියට 2010 ජනවාරි 15 දින ඉදිරිපත් වීමෙන් පසුව හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් නොපවත්වා රිමාන්ඩ් භාරයට පත් කරන ලදි.

3. මෙම සිද්ධියට අදාල වෛද්‍ය වාර්තාව අනුව මියගිය අය සිද්ධියෙන් පසු හෘදයබාධයකින් මියගොස් ඇති බවට කරුණු හෙලිවන නමුත්, අදාළ ස්ථානයේ ඇති වු හදිසි සටනේදී මියගිය අයට බරපතල තුවාල සිදුවීමක් වූ බවට කරුණු හෙලිදරව් නොවේ.

4. ඉහත කරුණු මත නීතිපති උපදෙස් ලබා දණ්ඩ නීති සංග්‍රහයේ 297 වගන්තිය යටතේ හෝ 317 වගන්තිය යටතේ කරුණු ඉදිරිපත් කරනු වෙනුවට 296 වන වගන්තිය යටතේ කරුණු ඉදිරිපත් කිරීම නිසා මහේස්ත්‍රාත්තුමාට ඇප දීමට අධිකරණ බලය නැතිවී ඇත.

5. මෙම සැකකරුට එදිරිව ඔහුව ඉදිරිපත් කරන අවස්ථාවේදී හෝ ඊට පසුව මෙම නඩුව අධිකරණයේ කැඳවූ අවස්ථා දෙකකදී හෝ කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් වී නොතිබූ හෙයින් ඔහුව මුදා හැරීමට ඉල්ලීමක් කරනු ලැබූ අතර ඒ අනුව ඒ ගැන සොයා බැලීමට පොලීසියට අවස්ථාවක් දෙන ලදී. ඉන් පසුව නඩුව කැඳවූ අවස්ථාවේදී පොලීසිය විසින් ඊට ප්‍රථම කටඋත්තර දී තිබූ රන්මුතු සුසන්ත ලවා මෙම සැකකරුගේ නම සඳහන් කර වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. (මුල් බී වාර්තාවේ සහ වැඩි දුර වාර්තාවේ සහතික පිටපතක් පෙ1 සහ පෙ2 ලෙස ලකුණු කර ඉදිරිපත් කෙරේ)

6. මේ පිළිබඳව දැනටමත් ගරු නීතිපතිතුමා දැනුවත් කර ඇති අතර මෙම සැකකරුට එරෙහිව උවමනාවෙන් අසත්‍ය සාක්ෂි ඉදිරිපත් කර තිබෙන බව පැහැදිලිව පෙනී යයි.

7. මෙම සැකකරු වයස අවුරුදු 23 ක අවිවාහක රියදුරෙකු වශයෙන් ජීවිකාව ගෙන යයි. මෙම සැකකරුට පෙර වැරදි හෝ පවත්නා නඩු නැත.

8. මේ සම්බන්ධයෙන් මීට ප්‍රථම ඇප ඉල්ලුම්පතක් මහාධිකරණයට ඉදිරිපත් කර නැත.

එසේ හෙයින් ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,

I. වගඋත්තරකරුවන්ට ඉතාමත් කෙටි දිනකදී නොතිසි නිකුත් කරන ලෙසත්

ii. තුන්වන සැකකරු සුදුසු ඇපයක් මත මුදා හරින ලෙසත්

iii. අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් ඕනෑම සහනයක් ලබා දෙන ලෙසත්ය

## කුරුණෑගල මහාධිකරණයේදී

1997 අංක 30 දරණ ඇප පනතේ 13 වන ගනතිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ඇප ඉල්ලුම් පත්‍රයයි.

රාජකාරි මුදියන්සේලාගේ කපුරු බණ්ඩාර කුසුම්, මාකඳුර, පන්නල

**පෙත්සම්කරු**

VS

**1. නීතිපති තුමා,**
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

**2. ස්ථානාධිපති,**
පොලිස් ස්ථානය,
පන්නල,
වගඋත්තරකරු.

**එදිරිව**

ආර්.එම්. සුවඳ බණ්ඩාර
තුන්වන සැකකරු

කුලියාපිටිය
මහේස්ත්‍රාත් අධිකරණ
නඩු අංක :B 278 / 2010
මහාධිකරණ ඇප ඉල්ලුම්පත්
අංක :BA61/2010

පන්නල, මාකඳුර, හි පදිංචි රාජකාරි මුදියන්සේලාගේ කපුරු බණ්ඩාර වන මම බෞද්ධාගම්කාරයෙකු වශයෙන් සත්‍ය ලෙසද, ගරු ගාම්භීරතා පූර්වකවද ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වගනම්,

1. මෙම සිද්ධි ප්‍රකාශකද, ප්‍රතිඥා දෙන්නාද මම වෙමි.

2. මෙම ඇප අයදුම්පත්‍රය මඟින් ඇප ඉල්ලා සිටින ආර්.එම්.සුවඳ බණ්ඩාර යන මෙම නඩුවේ තුන්වන සැකකරු මාගේ පුත්‍රයා වන අතර, ඔහු සම්බන්ධව මා හට තොරතුරු ප්‍රකාශ කිරීමට හැකි බවද ප්‍රකාශ කර සිටිමි.

3. මේ සම්බන්ධව ඉහත නම් සඳහන් සැකකරු 2010 ජනවාරි මස 05 දින ගල්ගමුගේ රසාංග ද සිල්වා යන අයගේ මරණය සම්බන්ධයෙන් අවශ්‍ය කරන බව දැනගත් වහාම පන්නල පොලීසියට ඉදිරිපත් වීමෙන් පසු හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක් නොපවත්වා රිමාන්ඩ් භාරයට පත්කර ඇත.

4. මෙම සිද්ධියට අදාළ වෛද්‍ය වාර්තාව අනුව මියගිය අය මියගොස් ඇත්තේ හෘදයාබාධයකින් බවත්, අදාල ස්ථානයේදී ඇති වූ සටනේදී මියගිය අයට බරපතල තුවාල සිදුවීමක්ද හෙළිදරව් වී නොමැත.

5. මා ප්‍රකාශ කර සිටින්නේ, ඉහත කරුණු මත නීතිපති උපදෙස් ලබා දණ්ඩ නීති සංග්‍රහයේ 297 වගන්තිය යටතේ හෝ 307 වගන්තිය යටතේ කරුණු ඉදිරිපත් කරනු වෙනුවට 296 වන වගන්තිය යටතේ කරුණු ඉදිරිපත් කිරීම නිසා මහේස්ත්‍රාත්තුමාට ඇප දීමට අධිකරණ බලය නැතිවී ඇති බවයි.

6. මා ප්‍රකාශ කර සිටින්නේ, මෙම සිද්ධියේ තුන්වන සැකකාර ආර්.එම්.සුවඳ බණ්ඩාර යන මාගේ පුත්‍රයාට එරෙහිව ඔහුව ඉදිරිපත් කරන අවස්ථාවේ හෝ නඩුව පසුව කැඳවූ අවස්ථාවන් දෙකකදී හෝ කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර, ඒ මත ඔහුව මුදා හැරීමට ඉල්ලීමක් කරනු ලැබීය. පසු අවස්ථාවේ නඩුව කැඳවූ විට පොලීසිය විසින් ඊට ප්‍රථම කට උත්තර දී තිබූ රන්මුතු වස්ත කුමාර ලවා මෙම සැකකරුගේ නම සඳහන් කරන ලද වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන ලද බවයි.

7. මා ප්‍රකාශ කර සිටින්නේ, මේ පිළිබඳව දැනටමත් නීතිපතිතුමා දැනුවත් කර ඇති අතර මෙම සැකකරුට එරෙහිව අසත්‍ය සාක්ෂි ඉදිරිපත් කර තිබීම පැහැදිලිව පෙනී යන බවයි.

8. මෙම නඩුවේ තුන්වන සැකකරු මාගේ පුත්‍රයා වන අතර, ඔහු වයස අවුරුදු 23 ක අවිවාහක, රියදුරෙකු ලෙස ජීවිකාව ගෙන යන අයෙකි. ඔහුට පෙර වැරදි හෝ පවත්නා නඩු කිසිවක් නැත.

ඉහත නම් සඳහන් ප්‍රතිඥා ප්‍රකාශකයින් විසින් කියවා බලා තේරුම් ගැනීමෙන් අනතුරුව නිවැරදි බවට පිළිගෙන වර්ෂ 2010 ක් ජූලි මස 24 වන දින කුරුණෑගල දී ප්‍රතිඥා දී අත්සන් තබන ලදී.

මා ඉදිරිපිටදීය

දිවුරුම් කොමසාරිස් / සාම විනිසුරු

## අධිකරණ කටයුත්තක දී ඉතාමත් අවශ්‍ය ලේඛනයක් වන
## මෝෂන් පත්‍රය
## කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේදී

ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
කෙසෙල්වත්ත,
පැමිණිලිකරු.

VS

එදිරිව
ඇන්.ඒ.සිරිපාල
සැකකරු

නඩු අංකය:
පෙර දිනය:
ඉදිරි දිනය:

2010 ක් ජුලි මස 24 වන දින දීය

ගරු මහේස්ත්‍රාත්තුමා වෙතටයි

ඉහත අංක දරණ නඩුවේ සැකකරු වෙනුවෙන් ඉල්ලීමක් කිරීම සඳහා මෙම නඩුව විවෘත අධිකරණයේ කැඳවන මෙන් අයදිමි.

සැකකරුගේ නීතිඥ
එ.බී.සී.වංශපාල

මෝසමකින් නඩු කැඳවිය හැකි අවස්ථා

**අ** ඇප ඉල්ලීමක් කිරීමට/ නියම කර ඇති ඇපය අඩු කරු ගැනීමට/ඇපකරුවන් ඉදිරිපත් කිරීමට සමහර අධිකරණ මෝසමේම අදාල කරුණු සඳහන් කිරීම කල යුතු බවට නියම කර ඇත.


**ආ** වරෙන්තුවට ඉදිරිපත් කිරීමට.
වරෙන්තුව ආපසු කැඳවනු ලැබු විට ඒ බවට අධිකරණයෙන් සහතිකයක් ලබා ගැනීමට උපදෙස් දීම ඉතා වැදගත් වේ.

**ඇ** භාණ්ඩ ලබා ගැනීමට.
භාණ්ඩ ඉල්ලීමක් කිරීමට මෝසමක් ඉදිරිපත් කල යුත්තේ එයට අයිතිවාසිකම් කියන පාර්ශවයන්ට දැනුම් දීමෙන් අනතුරුවයි.

මහේස්ත්‍රාත් අධිකරණයේ විවෘත අධිකරණයේ නඩුවක් කැඳවීමට ඉල්ලීමේදී වරෙන්තුවක් ආපසු කැඳවුන අවස්ථාවේදී හැර පොලිස් දිනයේ එය කිරීම ඉතා වැදගත් වේ. එකී මෝසමේ පෙර දිනය හා ඉදිරි දිනය සඳහන් කිරීම අනිවාර්ය වේ.

මහාධිකරණයක මෝසමකින් නඩුව විවෘත අධිකරණයේ කැඳවන අවස්ථාවේදී පෙර දිනය හා ඉදිරි දිනය සඳහන් කිරීම අනිවාර්ය නොවන නමුත් අදාල මෝසම රජයේ නීතිඥ විසින් දුටු බවට අත්සන් කර තිබීම අනිවාර්ය වේ. එමෙන්ම එකී මෝසම කැඳවීමට බලාපොරොත්තු වන දිනට ප්‍රථමයෙන් ගොනු කල යුතුවේ.

මෝසමක් වැදගත් වන අනිකුත් අවස්ථා ලෙස, සහතික පිටපත් ඉල්ලීම් කිරීම, ඇප මුදල ආපසු ලබා ගැනීටම ඉල්ලුම් කිරීම, අභියාචනා පෙත්සමක් ගොනු කිරීම, මහාධිකරණයක ඇප ඉල්ලුම් පත්‍රයක් හෝ ප්‍රතිශෝධන ඉල්ලීමක් ගොනු කිරීම යන අවස්ථාවන් සඳහන් කල හැක.



## 66 නඩුකර

මහේස්ත්‍රාත් අධිකරණයක 66 නඩුවක් යනුවෙන් සඳහන් කරන විට එය නොදන්නා පිරිසක් සිටින්නේ නම් ඉතාම අල්පයක් බව නොරහසකි. ප්‍රාථමික නඩු විධාන පනතේ 66 වගන්තියේ සිට ඉදිරියට ඇති වගන්ති වලින් කියවෙන දේපල සම්බන්ධ නඩු කටයුතු මෙමඟින් අදහස් කෙරේ.

මෙම නඩුකරයක් ආරම්භ කිරීමට ප්‍රධාන අංග දෙකක් සම්පුර්ණ කල යුතු වේ.

1. දේපල පිළිබඳ ආරවුලක් විය යුතුය.

2. ඒ හේතුවෙන් සාමය කඩවීමක් හෝ සාමය කඩවීමේ අවදානමක් ඇති විය යුතුය.

මෙම අංග දෙකම සම්පුර්ණ නොවන කල 66 වගන්තිය ප්‍රකාරව නඩු ඇසීමට මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය නැත. ප්‍රාථමික නඩු විධාන පනත පැනවීමට හේතු වූ ප්‍රාථමික අධිකරණ වර්තමානයේ ක්‍රියාත්මක වනුයේ ඉතාමත් සීමිත ප්‍රදේශ වල පමණක් හෙයින් මෙම නඩු කටයුතු මහේස්ත්‍රාත් අධිකරණ වලද විසඳනු ලැබේ. දේපල පිළබඳ ආරවුල් යන්නට එකී දේපලේ භුක්තිය මෙන්ම එයට බලපාන වෙනත් අයිතිවාසිකම් ද අදාල වේ. (උදා.පරවශතා අයිතීන්)

සාමය කඩවීම වැලැක්වීම පිණිෂ පනවා ඇති මෙම නඩුකර මඟින් පුද්ගලයින්ට තම දේපල කෙරෙහි අවදියෙන් සිටිමේ වැදගත්කම උගන්වනු ලැබේ.

“දේපල ගැන උනන්දුවක් නැතිව සිටි අයෙකුගේ දේපලකට යමෙකු අයුතු ඇතුල් වීමක් කර බලහත්කාරයෙන් මාස දෙකකට වඩා භුක්තියේ සිටිය හොත් සිවිල් අධිකරණයකින් අයුතු ඇතුල් වන්නා නෙරපන තුරු ඔහුව එම ස්ථානයෙන් නෙරපීමට නොහැකි තත්ත්වයක් මෙම නීතිය මඟින් ඇති කර තිබේ.”

පොලීසිය විසින් පාර්ශවකරුවන් අතර දේපල පිළිබල පිළිබඳ ආරවුල් විසඳීමට නොහැකි වූ විට තොරතුරු වාර්ථාවක් මඟින් එකී පාර්ශවකරුවන් අධිකරණයට ඉදිරිපත් කර සිටී.

එවැනි අවස්ථාවක සාමය කඩවීමක් සිදුවී තිබෙන බව හෝ සිදුවීමට ඉඩ තිබෙන බවට අධිකරණයකට පූර්ව නිගමනය කල හැක.

පුද්ගලිකව 66 වගන්තිය යටතේ නඩු පැවරීමේදී මීට වඩා වෙනස් තත්ත්වයක් හටගනී. එහිදී අයදුම්කරු විසින් සාමය කඩවී ඇති බව හෝ සාමය කඩවීමේ ප්‍රවනතාවයක් තිබෙන බවට අධිකරණය සෑහීමකට පත් කල යුතු වේ.

එසේ නොකරන තාක් කල් දැන්වීම් නිකුත් කිරීම අධිකරණයක් විසින් ප්‍රතික්ෂේප කල හැක. මෙවැනි පුද්ගලික නඩුවක් ගොනු කිරීමේදී සාමය කඩවීමේ තත්ත්වය අධිකරණයට ඒත්තු ගැන්වීම පිණිස පොලිසියට වරින් වර දෙපාර්ශවය විසින් කරන ලද පැමිණිලිවල සහතික පිටපත් අදාල ස්ථානයේ ඡායාරූප, පොලීසිය විසින් මෙම ප්‍රශ්නය විසඳීමට පියවර නොගෙන පක්ෂග්‍රාහීව සිටීම පිළිබඳව සම්ප්‍රකාශ දිවුරුම් ප්‍රකාශයට ඇතුළත් කිරීම වැදගත් වේ.

## 66 වගන්තිය යටතේ නඩුකරයක් පැවරූ විට අධිකරණයකට දිය හැකි නියෝග වර්ග

01) පනතේ 68 වන වගන්තිය පරිදි

අ) තොරතුරු වාර්තාව ගොනු කිරීමට ප්‍රථමයෙන් වු මාස 2ක් ඇතුළත භුක්තියේ සිටි අයකුට භුක්ත විඳීමේ අයිතිවාසිකමක් ඇති බව තහවුරු කරමින් නියෝගයක් ලබා දීම

ආ) තොරතුරු වාර්තාව ගොනු කිරීමට ප්‍රථමයෙන් වු මාස 2ක් තුළ භුක්තියේ සිටි අයකුගේ භුක්තිය බලහත්කාරයෙන් අහිමි කර ඇත්නම් ඔහුව නැවත භුක්තියේ පිහිටුවීමේ නියෝගයක් ලබා දීම

02) පනතේ 68 වන වගන්තිය පරිදි

දේපලක භුක්තිය පිළිබඳ ආරවුලක් නොවන වෙනත් නීතිමය අයිතිවාසිකමක් ඇත්නම් ඒ අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලසා දීම.

# 66 නඩුකරයක් හවුල් දේපලක් සම්බන්ධව පැවරිය නොහැක

දැන්වීම් අලවා වාර්තා කිරීමට නියම කල පසු අදාල ඉඩමේ දැන්වීම් ඇලවීම පිස්කල් විසින් කරනු ලබන අතර මුලින් ඉදිරිපත් වූ පාර්ශවයන්ට අමතරව අයිතිවාසිකම් ඇති වෙනත් අයටද මැදිහත් පාර්ශවයක් ලෙස ඉදිරිපත් වීමට එමඟින් අයිතිවාසිකම් සැලසේ.

වෙනත් දිව්රුම් ප්‍රකාශ වල මෙන් නොව තමන් ඉල්ලා සිටින සහන ඇතුලත් ආයාචනයක් මෙම දිවුරුම් ප්‍රකාශයට ඇතුලත් කල යුතු එම 66 නඩුවක විශේෂත්වයකි. එයට හේතුව මෙම නඩු විසඳනු ලබන්නේ දිවුරුම් ප්‍රකාශ හා එයට ඇතුළත් ලේඛණ ඡායාරූප මඟින් පමණක් වන නිසාය. එමෙන්ම හබ කරන ලද දේපල අධිකරණයට හඳුනාගැනීම පිණිෂ උපලේඛණයක් ඇතුලත් කිරීමද අත්‍යවශ්‍යවේ.

පුද්ගලිකව 66 නඩුවක් පවරන පාර්ශවකරුවෙකු ප්‍රථමයෙන් ගොනු කරනු ලැබිය යුත්තේ නඩුව ආරම්භ කිරීමට අවශ්‍ය තොරතුරු වාර්තාවක් ලෙසින් වන දිවුරුම් ප්‍රකාශයකි.

එහි අධිකරණ බලය ලැබීමට අවශ්‍ය, අදාල ආරවුල, දේපල පිළිබඳ ආරවුලක් බව සහ සාමය කඩවීමක් හෝ එසේ වීමේ ප්‍රවණතාවයක් ඇති බව සනාථ කරන කරුණු ඇතුළත් විය යුතුයි.

දැන්වීම් අලවා වාර්තා කල පසු, හදිසි අවස්ථාවක මහේස්ත්‍රාත්තුමාට දිය හැකි අවසාන නියෝග වලින් එකක් මුල් අවස්ථාවේම අතුරු ආඥාවක් ලෙසින් ලබා ගත හැක.

උදා : "යමකුව භුක්තියෙන් බලහත්කාරයෙන් නෙරපා ඇති විට ඔහුට යාමට වෙනත් ස්ථානයක් නොමැති පදනම මත ආරවුල විසඳා අවසාන නියෝගයක් දෙන තුරු නැවත භුක්තියේ පිහිටුවීමට අතුරු ආඥාවක් ලබා ගත හැක"

66 නඩුවක ස්ථාන පරීක්ෂාව කළ හැකි වන්නේ දෙපාර්ශවයේම එකඟත්වය පරිදි පමණි. ස්ථාන පරීක්‍ෂාවෙන් පසුව දෙනු ලබන නියෝගයක් අභියෝග කල හැකි වන්නේ නීතිමය කරුණක් වරදවා තේරුම් ගෙන අධිකරණයක් විසින් තීන්දුවක් දී ඇත්නම් පමණි.

දිව්රුම් ප්‍රකාශ ගොනු කිරීම කරන විට අනික් පාර්ශවයට පිටපතක් ලබා දී හරස් දිව්රුම් ප්‍රකාශ සඳහා අවස්ථාව ලබා ගත යුතුවේ.

හරස් දිව්රුම් ප්‍රකාශ ගොනු කිරීමේදී අනික් පාර්ශවයන්ට පිටපතක් ලබා දීම කර ලිඛිත සැලකිරීම් සඳහා අවස්ථාව ලබාගත යුතුවේ.

66 නඩුවක් සමථ කිරීමට හැකියාව තිබේද යන්න අධිකරණයක් විමසා බලනු ලැබිය යුතු අතර එසේ නොමැත්තේ නම් අදාල ලේඛණ මත නියෝගයක් ලබා දීම කෙරේ.

මහේස්ත්‍රාත් අධිකරණයෙන් දෙනු ලබන නියෝගය අවසාන නියෝගය නොවන නිසා අයිතිවාසිකමක් ලෙස එකී නියෝගයන්ට එරෙහිව අභියාචනා කිරීමට නොහැක.

එහෙත් සුවිශේෂී හේතු මත ප්‍රතිශෝධන ඉල්ලීමක් පළාත්බඳ මහාධිකරණයට කරනු ලැබිය හැක. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කර අත්හිටුවීමේ නියෝගයක් ලබා ගත හොත් මහේස්ත්‍රාත්තුමාගේ නියෝගය ක්‍රියාත්මක වීම නවතී.

පළාත්බද මහාධිකරණයක් විසින් දෙනු ලබන ප්‍රතිශෝධන නියෝගයකට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් තිබෙන අතර දින 14ක් ඇතුළත අභියාචනා පෙත්සමක් මහාධිකරණයේ ගොනු කිරීම තුලින් මහාධිකරණ නියෝගය ක්‍රියාත්මක වීම නොනවතී.

“මහේස්ත්‍රාත්තුමාට භුක්තිය පිළිබඳ නියෝගයක් ක්‍රියාත්මක කිරීමට ඇති බාධා ඉවත් කිරීමට නියෝග ලබා දිය හැක.”

භුක්තිය අහිමි කරන ලද ගොඩනැගිල්ල නියෝගය දෙන අවස්ථාවේ නොපවතින්නේ නම් භුක්තියේ පිහිටු වීම පිණිස එය නැවත සෑදීමට නියෝගයක් මහේස්ත්‍රාත්තුමාට කළ නොහැක. අදාල ස්ථාන කඩා දැමීමට වගකිව යුතු අයගෙන් වන්දි ලබා ගැනීම පිණිස සිවිල් නඩුකරයක් පැවරීමට අගතියට පත් අයට හැකියාව තිබේ.

# LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මිනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලැව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk

